වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

ඇබෑර්තු

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පහත සඳහන් පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුර : අභ්‍යන්තර විගණක

සුදුසුකම් :

(අ) බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගිණුම්කරණය / මූල්‍ය කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය (මූල්‍ය) / වාණිජ හෝ තනතුරට අදාළ වෙනත් විෂයයකට අදාළ ප්‍රථම උපාධියක් ලබා තිබීම.

සහ

ප්‍රථම උපාධිය ලැබීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් තිබීම.

02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට අයත් පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මාධ්‍ය පරීක්ෂණය සමත් වී තිබීම.

සහ

තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් තිබීම.

(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

01. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
02. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කණිෂ්ඨ කළමනාකාර (JM) කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප් පරිමාණය :

රු. 91,690/-, 10x2, 480/-, 15x3, 450/-, 168,240/- (MM 1-1-2025 - II ශ්‍රේණිය) (මාසිකව) (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි II වන උපලේඛනයට අනුව) + අනුමත රජයේ දීමනා.

බඳවා ගැනීමේ පටිපාටිය :

පත්වීම් බලධාරියා විසින් පත් කරන ලද මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක (Structural Interview) ප්‍රතිඵල මත.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

- අදාළ අතිරේක පළපුරුද්ද: ලකුණු 30
- අදාළ අතිරේක අධ්‍යාපනික සුදුසුකම්: ලකුණු 30
- අනෙකුත් ජයග්‍රහණ: ලකුණු 15
- සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධනය: ලකුණු 25
- එකතුව : ලකුණු 100

වයස : අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

වෙනත් : මෙම වර්ගීකරණය සඳහා වන සියලුම බඳවා ගැනීම් මෙම බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියට අනුව සිදු කරනු ලැබේ.

ඔබගේ වැටුපෙන් අවම වශයෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලට (EPF) හෝ ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක අරමුදලට (Ceylon Planters' Provident Society) දායක විය යුතු අතර, එම අර්ථසාධක අරමුදලට SLSPC දායකත්වය ඔබගේ වැටුපෙන් උපරිම 12% ක් සහ සේවක භාරකාර අරමුදලට (ETF) 3% ක් වේ.

අයදුම්පත් ඉදිරිපත් කිරීම :

අයදුම්කරුවන් සියලු විස්තර සහ උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික සහ සේවා පළපුරුදු සහතිකවල පිටපත් සමඟ තම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

රජයේ / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් අයදුම්පත් යොමු කළ යුතුය.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය : 2026 ඔක්තෝබර් 22 වන දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ යොමු කළ යුතුය.

සභාපති
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
අංක 257, සිරිධම්ම මාවත, කොළඹ 10.

Gazette.lk
AMBITIONS REALIZED